ජාතික අධ්‍යාපන ආයතනය

අධ්‍යාපන කළමනාකරණය පිළිබඳව අධ්‍යාපනපති පාඨමාලාව

MEd (Education Management) 2021 / 2022 (SLQF 10)

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උක්ත පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාව පැවැත්වෙන ස්ථානය** : අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක.

**පාඨමාලා කාලසීමාව** : අවුරුදු දෙකයි. (සති අන්තයේ සහ අවශ්‍යතාවය පරිදි සතියේ දින සවස 6.00 න් පසු දේශන පැවැත්වේ.)

**මාධ්‍යය** : සිංහල හා දෙමළ

**පාඨමාලා ගාස්තුව** : රු. 150,000.00 (වාරික දෙකකින් ගෙවිය හැක) + ලියාපදිංචි ගාස්තුව රු. 5,000.00 + විභාග ගාස්තු

**පවත්වන ආකාරය** : සම්මිශ්‍රිත ක්‍රමය (Blended Learning) - Online / Face to Face

**2021 නොවැම්බර් මස පාඨමාලාව ආරම්භ කිරීමට නියමිතය.**

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් :**

(i) අධ්‍යාපනවේදී උපාධිය හෝ ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධියක් සමඟ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (SLEAS) / ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය (SLTES) / විදුහල්පති සේවය (SLPS) / ශ්‍රී ලංකා ගුරු උපදේශන සේවය (SLTAS) /ශ්‍රී ලංකා ගුරු සේවය (SLTS) හෝ අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ වෙනත් අධ්‍යාපන ආයතනයක ප්‍රධානී තනතුරක් හෙබවීම

**බඳවා ගැනීමේ ක්‍රමය :**

- සම්මුඛ පරීක්ෂණයක් මගින් **හෝ** ප්‍රවේශ විභාගයක් හා සම්මුඛ පරීක්ෂණය මගින් සිදු කරනු ලැබේ. ප්‍රවේශ විභාගය පැය 02 ක අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය දැනීම හා පැය 01 ක අභියෝග්‍යතාව පිළිබඳ ලිඛිත ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

- අදාළ අයදුම්කරුවන් තෝරා ගනු ලබන අධ්‍යයන වර්ෂයේදී ජාතික අධ්‍යාපන ආයතනයේ කිසිදු පූර්ණ කාලීන /අර්ධ කාලීන පාඨමාලාවක් හෝ කිසියම් ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරමින් නොසිටිය යුතුය.

**අයදුම්පත් යොමු කළයුතු ආකාරය :**

1. ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියේ ( www.nie.lk/olcmed2app21.aspx ) හි ඇති මාර්ගගත පෝරමය (Online Form) පිරවීම මගින්

සහ

2. ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියේ ( www.nie.lk/naddpage.aspx ) ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඉල්ලුම් පත්‍රය ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව **ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින්, ලංකා බැංකුවේ ඕනෑම ප්‍රධාන ශාඛාවක ගිණුම් අංක 7041168** ට අයදුම්පත් ගාස්තු රු. 1500/-ක් බැර කළ යුතුය. ලදුපත පිරවීමේ දී අයදුම්කරන්නාගේ නම හා MEd (Education Management) ලෙස සඳහන් කරන්න.
   එම ලදුපත, අයදුම්පත සමග අමුණා **අධ්‍යක්ෂ, අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2021. සැප්තැම්බර් මස 05 වන දිනට පෙර එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ MEd (Education Management) 2021 / 2022 - (සිංහල / දෙමළ) යනුවෙන් සඳහන් කළ යුතුය.

- ඔබගේ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප වුවහොත් අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
- වැඩිදුර විස්තර සඳහා 0117601436 දුරකථන අංකයට සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා අමතන්න.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.